*සැ. යු.*– 2006.07.07 දින පළ වූ අංක 1453 දරන ගැසට් පත්‍රයේ **IV** (අ) කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,454 - 2006 ජූලි 14 වැනි සිකුරාදා - 2006.07.14**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 860 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 856 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 861 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*– (i) විවාහ ලියාපදිංචි කිරීමේ සංශෝධන) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූලි මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය - හලාවත

### අධිකරණයට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. හලාවත මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ මෙතෙක් කිසිවකු හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2006.07.22 සෙනසුරාදා පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට 1/2 පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේදී මිළදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේදීම මුදලින් ගෙවිය යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම් භාර නොගන්නා අතර එදින පෙ. ව. 6.00 ට ප්‍රථම සියළුම භාණ්ඩ අධිකරණයෙන් ඉවත්කර ගත යුතුය.

06. වෙන්දේසියේදී භාණ්ඩ මිළදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

කුමාරි එම්. අබේරත්න),
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
හලාවත.

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 45535 | අංක 41 ශ්‍රී 2259 දරන ලොරිය |
| 02. | ඒ. ආර්. 714/04 | චැසි අංක අයි. පී. 001394 හා එන්ජින් අංක 001859 දරන යතුරු පැදිය |
| 03. | බී. ආර්. 151/04 | චැසි අංක ජේ 005/570/6711 එන්ජින් අංක ජේ. ඩී. 05503391 යතුරු පැදිය |
| 04. | ඒ. ආර්. 709/04 | 1188469 දරන හොන්ඩා වර්ගයේ යතුරු පැදිය |
| 05. | නඩු අංක රහිත | 1497638 දරන හොන්ඩා යතුරු පැදිය |
| 06. | නඩු අංක රහිත | සුසුකි 125 වර්ගයේ යතුරු පැදිය |
| 07. | -එම- | 9464 සඳහන් යමහා මේට් 50 වර්ගයේ යතුරු පැදිය |
| 08. | -එම- | 82 ශ්‍රී 9957 දරන හොන්ඩා 90 වර්ගයේ යතුරු පැදිය |
| 09. | -එම- | ලි. ප. අංක 117-4424 දරන හොන්ඩා එන්. බී. වර්ගයේ නිල් පැහැති තැලී පොඩිවී ගිය යතුරු පැදිය |
| 10. | -එම- | 105-396 දරන යමහා මේට් 90 වර්ගයේ රතු පැහැති යතුරු පැදිය |
| 11. | -එම- | හොන්ඩා සී. 90 සුපකප් වර්ගයේ පිලිස්සී ගිය යතුරු පැදිය |
| 12. | නඩු අංක රහිත | සුසුකි වර්ගයේ පිලිස්සී ගිය යතුරු පැදිය |
| 13. | -එම- | 24033133 එවොන් වර්ගයේ පා පැදිය |
| 14. | -එම- | 680009 දරන ඉදිරි පස රෝදය නොමැති පාපැදිය |
| 15. | -එම- | 3343703 දරන ලුමාලා ස්ටෑන්ටඩ් වර්ගයේ මඩ්ගාඩ් සහිත පා පැදිය |
| 16. | -එම- | අංකය, වර්ගය අපැහැදිලි කළු පැහැති පා පැදිය |
| 17. | -එම- | ඩී. බී. 800239 දරන ග්ලෝබ්ලයින් සුපර් පා පැදිය |
| 18. | -එම- | 23938751 දරන ලුමාලා නිල් පැහැති පා පැදිය |
| 19. | -එම- | සී. පී. 0368 දරන අංකය අපැහැදිලි පා පැදිය |
| 20. | -එම- | අංක රහිත ඕ. ඊ. 709225 ඊස්ටන් ස්මාට් එස්. එල්. ආර්. පා පැදිය |
| 21. | -එම- | ඒ. 1280523 ලුමාලා වර්ගයේ පා පැදිය |
| 22. | -එම- | අංක ඒ. එස්. 3818 වර්ගය අපැහැදිලි ෂීට් නොමැති පා පැදිය |
| 23. | -එම- | 5 සීසී 11534 දරන රැලේ ස්පෝර්ට් පා පැදිය |
| 24. | -එම- | අංකය වර්ගය අපැහැදිලි කොළ පාට ආවරණය කරන ලද පා පැදිය |
| 25. | -එම- | කේ. එච්. 0487 දරන සිල්ව පාට පා පැදිය |
| 26. | -එම- | 24053213 ලුමාලා වර්ගයේ රතු පැහැති ස්පෝර්ට් වර්ගයේ පා පැදිය |
| 27. | -එම- | ඩී. සී. සී. 72312 ලුමාලා වර්ගයේ බාග පා පැදිය |
| 28. | -එම- | ජී. එච්. 318 දරන සුදු පාට ආලේප කරන ලද ෂීට් එක නොමැති පා පැදිය |
| 29. | -එම- | 7 ඒ. 68588 දරන පා පැදිය |
| 30. | -එම- | 59702171 දරන ලුමාලා බයිසිකලය |
| 31. | -එම- | අංක වර්ගය නොමැති නිල් පාට ස්පෝට් පා පැදිය |
| 32. | -එම- | එස්. එම්. 9283 දරන රත්තරන් පාට ආලේපිත අඩව් වන බයිසිකලය |
| 33. | -එම- | අංක 55731661 දරන පා පැදිය |
| 34. | -එම- | 2053061 දරන නිල් පැහැති ලුමාලා ස්පෝට් පා පැදිය |
| 35. | -එම- | කොළපාට මවුන්ටන් පා පැදිය |
| 36. | -එම- | අංකය වර්ගය අපැහැදිලි ස්පෝර්ට් පා පැදිය |
| 37. | -එම- | අංක අපැහැදිලි රතු පාට ලේඩිස් පා පැදිය |
| 38. | -එම- | එස්. 9202 දරන මවුන්ටන් වර්ගයේ පා පැදිය |
| 39. | -එම- | අංක 12244226 දරන ලුමාලා වර්ගයේ බයිසිකලය |
| 40. | -එම- | අඩි 20 ක් පමණ දිග අහල් 4 ක් පමණ බට 05 අඩි 12 ක් පමණ කැබලි 02 යි විෂ්කම්භය අහල් 6 අඩි 20 ක් පමණ එස්ලෝන් බට 07 යි |
| 41. | 80011 | ජේ. අයි. ඉසිට් 6 විදුලි බුරුම 01 යි |
| 42. | 92897 | නිල් පැහැති සම්බන්ධතා අංක 072434556 දරන නොකියා 3310 වර්ගයේ ජංගම දුරකථනය |
| 43. | 57255 | විදුලි මීටර් 01 යි |
| 44. | අංක රහිත | හිස් බූලි තොගයක් |
| 45. | -එම- | ඇලුමිනියම් මුට්ටි තොගයක් |

| | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 46. | අංක රහිත | යකඩ බැරල් තොගයක් |
| 47. | 59594 | නිල් පාට ෂෙල් ගෑස් වර්ගයේ ගෑස් සිලින්ඩර් 01 යි |
| 48. | 85097 | සෙන්ට්‍රික් වර්ගයේ අඟල් 1 ½ ප්‍රමාණයේ අංක 5089 දරන වතුර මෝටර් 01 යි |
| 49. | 87065 | සවල් 01 යි |
| 50. | 88672 | වේවැල් කූඩ 01 යි |
| 51. | 84488 | සවල් 01 යි |
| 52. | 90082 | සවල් 01 යි |
| 53. | 93008 | කූඩ 01 යි |
| 54. | 92792 | සවල් 01 යි |
| 55. | 92786 | සවල් 01 යි |
| 56. | 92790 | සවල් 01 යි |
| 57. | 92231 | වේවැල් කූඩ 01 යි |
| 58. | 92232 | යකඩ බාල්දි 01 යි |
| 59. | 92189 | සවල් 01 යි |
| 60. | 92190 | සවල් 01 යි. |
| 61. | 92234 | යකඩ බාල්දි 01 යි වේවැල් කූඩ 01 යි |
| 62. | 92188 | සවල් 01 යි |
| 63. | 92789 | සවල් 01 යි |
| 64. | 92233 | වේවැල් කූඩ 01 යි |
| 65. | 85754 | උදලු 01 යි |
| 66. | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් |
| 67. | -එම- | තැලූ දහර තොගයක් |
| 68. | 90006 | වයර් අඩි 60 ක් |
| 69. | 90007 | වයර් අඩි 100 ක් |
| 70. | 95976 | වයර් අඩි 110 ක් |
| 71. | 95977 | වයර් අඩි 80 ක් |
| 72. | 95778 | වයර් අඩි 100 ක් |
| 73. | 95979 | ටෙලිෆෝන් වයර් අඩි 80 ක් |
| 74. | 95980 | වයර් අඩි 60 ක් |
| 75. | අංක රහිත | නරක් වී ගිය පොල් තොගයක් |
| 76. | | |

මෙම අධිකරණය ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් අධිකරණ භාවිතයේ පැවැති ඉවත් කළ භාණ්ඩ පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 01. | වහල සෙවිලි කරන ලද උළු, | - 4500 පමණ තොගයක් |
| 02. | විවිධ ප්‍රමාණයේ උළුවහු | - 13 යි |
| 03. | ජනෙල් පියන් | - 12 යි |
| 04. | ජනෙල් රාමු පියන් | - 02 යි |
| 05. | දැල් සහිත ජනෙල් රාමු පියන් | - 03 යි |
| 06. | යකඩ සහිත ජනෙල් රාමු | - 03 යි |
| 07. | යකඩ රහිත ජනෙල් රාමු | - 01 යි |
| 08. | දොර පියන් | - 20 යි |
| 09. | දැල් රහිත දොර පියන් | - 02 යි |
| 10. | කොටු සහිත ලී දොරවල් | - 04 යි |
| 11. | අඩි 08 ක් උස ලීකණු | - 05 යි |
| 12. | අඟල් "6×4" දිග අඩි 12 බාල්ක | - 01 යි |
| 13. | අඟල් "6×4" දිග අඩි 10 බාල්ක | - 01 යි |
| 14. | අඟල් "2×4" ලී කැබලි | - 25 යි |
| 15. | අඟල් "3×4" ලී කැබලි | - 40 යි |
| 16. | අඟල් "2×2" ලී කැබලි | - 50 පමණ |
| 17. | රීප්ප තොගයක් | |
| 18. | දොර ජනෙල් වලින් ඉවත් කරන ලද පළුදු වූ ලෑලි තොගයක් | |
| 19. | තහඩු කැබැලි 07 යි | |
| 20. | ගලවා ඉවත් කල සිවිලින් ෆෑන් 09 යි | |
| 21. | අඩි 04 ටියුබ් ලයිට් ආවරණ 20 යි | |
| 22. | ද්වත්ව ලයිට් ආවරණ 02 යි, ලයිට් 02 යි | |
| 23. | ප්‍රධාන ස්විච් 01 යි, ට්‍රිප් ස්විච් 01 යි, බ්‍රේකර් 08 යි | |
| 24. | සින්ක් 03 යි | |
| 25. | කොමඩ් 01 යි | |
| 26. | සින්ක් රඳවන බට 02 යි | |
| 27. | ගලවා ඉවත් කරන ලද වයරින් වයර් තොග 01 යි | |
| 28. | රෙගුලේටර් 09 යි | |
| 29. | ටියුබ් ලයිට් 36 යි | |

07-229

---

මගේ අංකය - පීඒ/එස්එස්පී/1141/2006.
පොලිස් අධිකාරි කාර්යාලය,
කැළණිය,
2006.06.28.

## පොලිස් දෙපාර්තමේන්තුව

### අබලි භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

කැළණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානවල පාවිච්චියෙන් පසුව ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩ 2006.07.29 වන දින සපුගස්කන්ද පොලිස් ස්ථාන භූමියේදී පැය 0900 ට ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ.

අදාල භාණ්ඩ පරීක්ෂා කිරීම 2006.07.26 වන දින පැය 0900ට සිට පැය 1600 දක්වා සපුගස්කන්ද පොලිස් ස්ථාන භූමියේදී සිදුකල හැක. වෙන්දේසි භූමියට ඇතුල්වීමේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

වෙන්දේසියෙන් ලබා ගන්නා ලද භාණ්ඩ වෙනුවෙන් එදිනම මුදල් ගෙවා පොදු 172 පෝරමය ලබාගත යුතු අතර, භාණ්ඩ එදිනම පොලිස් ස්ථාන භූමියෙන් ඉවත් කර ගත යුතුය. ඉවත් කර නොගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

ඒ. ඩී. යූ. එස්. කේ. ගුණසේකර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
කැළණිය කොට්ඨාශය.

2006 ජුනි මස 27 වැනි දින,
කැළණිය පොලිස් අධිකාරි කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| අනු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | ආරක්ෂක පෙට්ටි (ලී) | 02 |
| 02. | විරාම ඔර්ලෝසු | 03 |
| 03. | කාසි පත්තෝරු | 01 |
| 04. | ගෑස් ලිප් 21" X 21" | 14 |
| 05. | කළු පොලියෙස්ටර් රෙදි මීටර් | 06 |
| 06. | ඇලුමිනියම් මල්ටි පොට් | 15 |
| 07. | කැසට් යන්ත්‍ර | 01 |

| අනු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 08. | ඉබි යතුරු පිත්තල | 46 |
| 09. | කැල්කියුලේටර් | 04 |
| 10. | නිල ඇඳුම් දමන ලී පෙට්ටි | 10 |
| 11. | සිංහල යතුරු ලියන | 21 |
| 12. | ඉංග්‍රීසි යතුරු ලියන | 26 |
| 13. | වර්ණ රූපවාහිනී යන්ත්‍ර | 05 |
| 14. | කලු සුදු රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 15. | දුරකථන හුවමාරු යන්ත්‍ර | 02 |
| 16. | ගෑස් සිලින්ඩර් කි. 40 | 12 |
| 17. | වතුර මෝටර් | 11 |
| 18. | බොයිලේරු | 04 |
| 19. | කල්දේරම් ඇලුමිනියම් | 45 |
| 20. | වතුර පිල්ටර් | 25 |
| 21. | විදුලි කේතල | 16 |
| 22. | පැක්ස් යන්ත්‍ර | 01 |
| 23. | මේස විදුලි පංකා | 13 |
| 24. | බිත්ති විදුලි පංකා | 04 |
| 25. | යකඩ අල්මාරි | 03 |
| 26. | පොරව තල | 04 |
| 27. | ලී බංකු | 32 |
| 28. | ගැල්වනයිස් බාල්දි | 46 |
| 29. | යකඩ ඇඳන් | 55 |
| 30. | ලිපිකරු පුටු | 35 |
| 31. | යකඩ තාච්චි | 04 |
| 32. | විදුලි ඉස්තිරික්ක | 02 |
| 33. | සිවිලිං පංකා | 15 |
| 34. | පයිල් කැබිනට් | 02 |
| 35. | කුෂන් පුටු | 22 |
| 36. | යකඩ අලවංගු | 01 |
| 37. | යකඩ පුටු | 107 |
| 38. | ඇලුමිනියම් ජෝගු | 03 |
| 39. | මේස පිහි | 19 |
| 40. | ලන්තෑරුම් | 01 |
| 41. | යකඩ චේන් කෑලි | 31 |
| 42. | බිත්ති ඔර්ලෝසු | 06 |
| 43. | ගිනි නිවන උපකරණ | 06 |
| 44. | හෙල්මට් | 10 |
| 45. | විදුලි පන්දම් | 04 |
| 46. | ඇලුමිනියම් බේසම් | 04 |
| 47. | හිරමන | 03 |
| 48. | ඇලුමිනියම් පිඟන් | 53 |
| 49. | මේස හැඳි | 13 |
| 50. | මල්කපන කතුරු | 01 |
| 51. | විසිකැති | 07 |
| 52. | ක්‍රිකට් හෙල්මට් | 07 |
| 53. | රේසින් හෙල්මට් | 17 |
| 54. | පාපැදි | 46 |
| 55. | ලවුඩ් ස්පීඩ් | 01 |
| 56. | ලී අල්මාරි | 06 |
| 57. | හදිසි ලාම්පු | 05 |
| 58. | ටියුබ් ලයිට් කේස් | 03 |
| 59. | පන්වර් | 13 |
| 60. | රෝතියෝ මැෂින් | 02 |
| 61. | ඡායා පිටපත් යන්ත්‍ර | 02 |
| 62. | ඉලෙක්ට්‍රොනික් යතුරු ලියන | 01 |
| 63. | බ්‍රීප් කේස් | 02 |

07-226

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - වත්තල

### රාජසන්තක හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම

වත්තල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2006.08.05 වන දින පෙ. ව. 9.30ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එම වෙන්දේසියේ ඇති යම් භාණ්ඩයක් විකිණීම සම්බන්ධයෙන් විරෝධතාවයක් ඇත්නම් එය වෙන්දේසිය පැවැත්වීමට ප්‍රථම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට දැනුම් දිය යුතුය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට ප්‍රථම භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකි අතර, ඊට පෙරාතුව භාණ්ඩ පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

මිලදී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතුය.

භාණ්ඩ මිලදී ගන්නා අයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, සියලු ගෙවීම් මුදලින් කළ යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

ඒ. ඩී. විජේවර්ධන,
මහෙස්ත්‍රාත් - වත්තල.

2006 ජූනි මස 13 වන දින,
වත්තල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| 01 | ඒ 274/05 | වාහන වලට සවි කරන රිම් වලලු 02 අඩි 06ක් පමණ දිග යකඩය |
| 02 | 14203 | දහර 01 |
| 03 | 15134 | දහර 05 |
| 04 | 9806 | දහර 01 |
| 05 | 17204 | දහර 07 |
| 06 | ඒ 930/05 | බෝය කඹය |
| 07 | 89340 | පිත්තල පහනක උඩකොටස පිත්තල වළල්ල (විශ්කම්භය අඩි 6ක් වන ) |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| 08 | 14330 | කාඩ්බෝඩ් පෙට්ටි මුද්‍රා තැබීමට යොදා ගන්නා තහඩු පටි අඩංගු පෙට්ටි 06<br>සෙලෝටේප් රෝල් 05 |
| 09 | ඒ 861/04 | විවිධ වර්ණයේ සාරි 05<br>රෝද සහිත ගමන් මලු 01 |
| 10 | 5601 | අඩි 7 1/2ක් දිග රේල් පීලි 1<br>අඩි 11ක් දිග රේල් පීලි 1<br>අඩි 12 1/2ක් දිග රේල් පීලි 1<br>ස්ටෑන්ඩඩ් පාපැදිය<br>නිල්පාට ෂෙල් ගෑස් සිලින්ඩරය<br>ගෑස් රෙගියුලේටරය සහ වයරය<br>පොරව |
| 11 | බී 1195/05 | පා පැදි 4 |
| 12 | 13706 | ඊ. එජ්. 1244 සුපර් පීනික්ස් පා පැදිය |
| 13 | 97911/85822 | එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය |
| 14 | 11402 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 15 | 1210 | ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථනය |
| 16 | 97524 | බුරුසු අඩංගු උරය |
| 17. | ඒ1529 | මහන මැෂිමක උඩකොටස පරණ සෝස්පෑන් 3<br>යකඩ කොටස් කීපයක් |
| 18. | 66822 | දිරාපත්වී ගිය රෙදි අඩංගු උරය |
| 19 | 43403 | දිරාපත් වී ගිය රෙදි අඩංගු උරය |
| 20. | බී 8209 | කළු පැහැති කුඩා බෑග් අඩංගු උර 2 |
| 21. | - | බුරුසු අඩංගු උර 2 |
| 22. | - | රෝස හා නිල් පැහැති ලොකු කුඩා බුරුසු අඩංගු උර 2 |
| 23. | - | රතුපාට ප්ලාස්ටික් පුටු 1<br>සුදුපාට ප්ලාස්ටික් පුටු 4 |
| 24. | - | වීදුරු බෝල් 1 |
| 25. | - | වීදුරු 24 |
| 26. | - | කරිදීසි 14 |
| 27. | - | පිහන් 20 |
| 28. | - | රතුපාට ප්ලාස්ටික් බේසම |
| 29. | - | නිල්පාට ප්ලාස්ටික් බාල්දිය |
| 30. | - | කැඩුනු බිත්ති ඔරලෝසු 10 |
| 31. | - | බුරුසු අඩංගු උර 2 |
| 32. | - | නිල්පාට පරණ සිල්ක් රෙදි අඩංගු උරය |
| 33. | - | පාටමල් වැටුනු දිරාගිය ගවුම් අඩංගු උරය |
| 34. | - | කොළපාට බෑග් අඩංගු උරය |
| 35. | - | නිල්පාට සිල්ක් රෙදි අඩංගු උරය |
| 36. | - | දිරාපත් වූ කිමිදුම් කට්ටලය |
| 37. | - | දිරාපත් වූ දොර රෙද්දක් |
| 38. | - | නිල්පාට ප්ලාස්ටික් ඇට අඩංගු පොහොර උරය |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| 39. | - | ලාම්පු ආවරණ එකයි |
| 40. | - | වාහන පැතිකණ්නාඩි අඩංගු උරය |
| 41. | - | නිල්පාට දැල් රෙද්දක් අඩංගු උරය |
| 42. | - | දිරාපත් වූ කලාප පැදුරු 05 |
| 43. | - | වීත්ත ගවුම් හා කොට කලිසම් අඩංගු උරය |
| 44. | - | යකඩ කකුල් සහිත ස්ටූල් එකයි |
| 45. | - | විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් කෑන් තොගය |
| 46. | - | විවිධ වර්ගයේ වීදුරු බෝතල් තොගය |
| 47. | - | විවිධ වර්ගයේ වීදුරු කීපයක් |
| 48. | - | කුෂන් කළ කෑම මේස පුටු 4 |
| 49. | - | විශාල ඇළුමිනියම් මුට්ටි 01 |
| 50. | 3364/04 | සී. පී. යූ. යන්ත්‍රය මොනිටරය |
| 51. | 3363/04 | සී. පී. යූ. යන්ත්‍රය මොනිටරය |
| 52. | 89196 | රන් කෑල්ල |
| 53. | 88096 | රන් මාලය |
| 54. | 98729 | පයිබර් ඔරු 2<br>පොල්පරාල කැබලි හා ලෑලි කැබලි |
| 55. | 98728 | පියබර් ඔරු 2<br>පොල්පරාල කැබලි හා ලෑලි කැබලි |
| 56. | 92526 | අංක 110 - 4236 දරන හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය |
| 57. | ඒ418/01 | අංක 91 ශ්‍රී 2844 දරන සී. ඩී. 90 යතුරු පැදිය |
| 58. | 2110 | අංක 106 ශ්‍රී 5681 දරන සුසුකි යතුරු පැදිය |
| 59. | ඒ 417/01 | අංක 105 ශ්‍රී 9908 දරන වැලි වර්ගයේ යතුරු පැදිය |
| 60. | - | අංකය අපැහැදිලි යමහා - මේට් යතුරු පැදිය |
| 61. | - | අංකය අපැහැදිලි සුසුකි යතුරු පැදිය |
| 62. | - | අංක 147 - 2238 දරන සී. ඩී. 125 යතුරු පැදිය |
| 63. | - | අංකය අපැහැදිලි සුසුකි යතුරු පැදිය |
| 64. | - | අංකය අපැහැදිලි එම් 90 හොණ්ඩා යතුරු පැදිය |
| 65. | බී 1998 | අංකය 21-7010 අබලන් ත්‍රීරෝද රථය |
| 66. | බී. 936 | අංක 21-5470 දරන අබලන් ත්‍රීරෝද රථය |
| 67. | බී. 325 | බුරුසු අඩංගු උරය |
| 68. | - | අඩුකෝප්ප අඩංගු පෙට්ටි 2 |
| 69. | - | ජර්කින් අඩංගු උරය |
| 70. | 6746 | දහර 2 |
| 71. | - | විවිධ ඇඳුම් අඩංගු උරය |
| 72. | - | දහර කොටස් |
| 73. | 16343 | දහර 01 |
| 74. | 14150 | දහර 10 |
| 75. | 10473 | දහර 05 |
| 76. | ඒ856/01 | රන්මාලය |
| 77. | - | යකඩ බැරල් තොගයක් |



B 2 - B 079281

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නිවිතිගල, වටාපොත, කිරිබත්ගල පාසල අසල හි පදිංචි පිටගම්පලගේ සුනිල් පද්මකුමාර වන මා විසින් අත්සන් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඉසෙඩ්. ඒ. අමින් හුසේන් 2005.10.31 වැනි දින සහතික කළ අංක 454 දරන ඇටර්නි බලපත්‍රය මගින් රත්නපුර, අංගම්මන පාර, අංක 58/1 හි පදිංචි ගනේගොඩ විදානෙලාගේ චන්ද්‍රරත්න වෙත දෙන ලද ඇටෝර්නි බලපත්‍රය සහ එහි සඳහන් බලය අවලංගු කොට බල රහිත කළ බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

පිටගම්පලගේ සුනිල් පද්මකුමාර.

07-212

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනීසිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

අවිස්සාවේල්ල, මාතියම්ගම, ගලබලනකන්ද පාර, අංක 564/9 හි පදිංචි උඩුවලාගේ සීතා රංජනී වීරක්කොඩි වන මම කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

යූ. එස්. ආර්. වීරක්කොඩි.

2006 ක් වූ ජුනි මස 28 වැනි දින,
අංක 564/9, ගලබලනකන්ද පාර,
මාතියම්ගම,
අවිස්සාවේල්ල.

06-208

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනීසිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පානදුර වලපල, අංක 151 හි පදිංචි හේවාදේවගේ ලුවිනා ප්‍රනාන්දු වන මම, කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස 107 වන අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියළු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එච්. ඩී. එල්. ප්‍රනාන්දු.

2006 ක් වූ ජුනි මස 28 වැනි දින,
අංක 151,
වලපල
පානදුර.

06-189

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනීසිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පානදුර ද සොයිසා පාරේ, අංක 51/9 හි පදිංචි, තොටහේවාරාලලාගේ ප්‍රින්සි විනිප්‍රඩ් ලොරිඩා ප්‍රනාන්දු වන මම, කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු දරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස 107 වන අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර්ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

ටී. පී. වී. එෆ්. ප්‍රනාන්දු,

2006 ක් වූ ජුනි මස 28 වැනි දින,
අංක 51/9,
ද සොයිසා පාර,
පානදුර.

06-190

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

දොඩම්ගොඩ, තුඩුගල, "විජිත" හි පදිංචි ලියනආරච්චිගේ සිරිසේන වන මම කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම දිසා අධිකරන කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනත් 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ඇල්. ඒ. සිරිසේන,

2006ක් වූ ජුනි මස 28 වැනි දින,
ඇල්. ඒ. සිරිසේන,
විජිත,
තුඩුගල පාර,
දොඩම්ගොඩ.

07-227

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

මතුගම බාලිකා පාරේ, අංක 87/1 හි පදිංචි හල්නෙත්ති මහින්ද ශ්‍රීලාල් සිල්වා වන මම කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත්වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

එච්. මහින්ද ශ්‍රීලාල් සිල්වා.

2006 ජුනි මස 26 වැනි දින,
අංක 87/1, බාලිකා පාර,
මතුගම.
06-164

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කෑගල්ල (හරහා) හැලමඩ මකුද්දල කිරිවාන පදිංචි රත්නායක මුදියන්සේලාගේ පුරනේ ගෙදර උක්කුබණ්ඩා රත්නායක වන මම කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107, අධිකාරය වන නොතාරිස් ආඥා පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව මෙදින සිට මසක් ඉකුත් වූ පසුව රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ අවසරය ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

ආර්. එම්. පී. යූ. බී. රත්නායක.

2006 ජූලි මස 30 වැනි දින,
කිරිවාන,
මකුද්දල- හැලමඩ.

07-260

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අගනා දේපළ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ දැනට කොල්ලුපිටිය 5 වැනි පටුමග 100/1 අංක දරන (බලයලත් මිනින්දෝරු එච්. ජී. සී. ඩයස් මහතා විසින් සාදන ලද 1960.05.20 දින හා අංක 224 දරන පිඹුරේ ලොට් ඒ 2 යනුවෙන් නිරූපිත නැවත මිනුම් කරන ලද ඉඩම් කොටස) බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් සාදන ලද 2003 මැයි මස 05 දිනය හා 1070 අංක දරන පිඹුරේ ඒ 2 යනුවෙන් නිරූපිත බෙදා වෙන්කළ ඉඩම් කොටස ඉඩම ප්‍රමාණයෙන් අ. 0, රූ, 0 පර්චස් 23.62, 224 අංක දරන පිඹුරේ ලොට් ඒ 3 යනුවෙන් සඳහන් කොටසේ පිහිටි මාර්ග අයිතිය ද එහි පිහිටි ගොඩනැගිලි හා සියලු දේ ද සමග රශීඩ් මොහොමඩ් මුර්ෂීඩ් හා ෆවුසුල් හනීයා මුර්ෂීඩ් යන අය විසින් (කලින් සීමාසහිත පෑන් ඒෂියා බැංකුව යනුවෙන් හඳුන්වන ලදී) පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හි උකස් කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේමනන්ත්‍රි විසින් සහතික කරන ලද 2006 පෙබරවාරි 10 දින හා 915 අංක දරන ඇපකරය යටතේ ගෙවීම් අතපසු කර ඇත.

පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් විසින් අප වෙත පවරන ලද බලතල අනුව 2006 අගෝස්තු මස 03 වන බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00 ට අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිල තීන්දු වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන පළාත් අධිකාරි බදු,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක් පමණක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. රු. 75,000 ක් නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත ගෙවිය යුතුය. යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006 ජුනි 23 සිලෝන් ඩේලි නිව්ස්, ලක්බිම හා සුඩර් ඔලී පුවත්පත් ද, එම දිනයේ රජයේ ගැසට් පත්‍රය ද බලන්න.

වැඩිදුර විස්තර ලබාගැනීමත්, හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල ලිපිලේඛන පරීක්ෂා කර බැලීමත් කොළඹ 3,ගාලු පාරේ අංක 450 හි සීමාසහිත පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් සාමාන්‍යාධිකාරී - නීති වෙතින් සිදුකළ හැකිය. දුරකථන අංක 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

| *ප්‍රධාන කාර්යාලය* : | *නගර කාර්යාලය* : |
|---|---|
| අංක 24, | අංක 55 ඒ, |
| ටොරින්ටන් පාර, | ධර්මපාල මාවත, |
| මහනුවර. | කොළඹ 3 |
| දුරකථන අංකය : 081-2227593 | දුරකථන අංක :2441761 |
| දුරකථන/ෆැක්ස් අංකය :081-2224371 | දුරකථන/ෆැක්ස් :2448526 |
| | ඊ මේල් :samera@sri.lanka.net |

07-211

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කටුනායක ශාඛාව

1990 අංක 4 දර බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රංගනී ද අල්විස් විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2003.12.17 දින අංක 977 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වලිමුනි දේවගේ සේනානි දීපිකා වීරසිරි සහ කොස්අන්ගේ ගෙදර සරත් හේමචන්ද්‍ර ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල්

බැංකුව මා වෙත පවරන ලද බලතල ප්‍රකාර අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2006 ක් වූ ජූලි මස 28 වැනි දින පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටුගොඩ පිහිටි මීගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එස්. පී. එන්. සඳගිරි විසින් මැන සාදන ලද අංක 856 සහ 2002 දෙසැම්බර් මස 12 වන දිනැති පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් නිරූපිත කොටස වේ.

විශාලත්වය පර්චස් 15.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා කරුණාකර 2006 ජනවාරි මස 20 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* ද 2006 මාර්තු මස 01 දින දරන අයිලන්ඩ් දිවයින, සහ තිනකරන් යන පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු වේ.

1. ගැණුම් මුදලින් 10%ක්ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු කළමණාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, කටුනායක ශාඛාව (දුරකථන අංක 4833458) හෝ කොළඹ ටී. බී. ජයා මාවතේ, අංක 479 හි පිහිටි ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) (දුරකථන අංක : 2661815/2661816)ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
අලුත්කඩේ, කොළඹ 12.

07-210

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-හෝමාගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මාවෙත පවරා දී ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගස්තු ඇතුළුව සියළු මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2006 ජූලි මස 28 වැනි බදාදා දින පෙ. ව. 10.00 ට ඇරඹෙන පරිදි එකී ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, (අවිස්සාවේල්ල ලියාපදිංචි කොට්ඨාසය තුළ) හේවාගම් කෝරලේ, මැදපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාව තුළ පනාලුව පිහිටි පනාලුව වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩම බලයලත් මානක කේ. ඩී. පී. වීරසිංහ විසින් මැන සාදන ලද 1996 අගෝස්තු මස 28 දිනැති අංක 1090 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක130 ලෙස නිරූපිත ඉඩම හා ලොට් අංක 131 ලෙස නිරූපිත ඉඩම වේ. විශාලත්වය ලොට් අංක 130, පර්චස් 16.41, ලොට් අංක 131, පර්චස් 16.33

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2002 ඔක්තෝබර් මස 21 සහ අංක 399 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නාඋල්ලගේ අරුණ තිලක් පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහ 2006 මැයි මස 19 දින දරන *ගැසට් පත්‍රය* සහ 2006 මැයි මස 30 දින ඩේලි නිවුස්, දිවයින හා තිනකරන් පුවත්පත්ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවේලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදලින් 10% ද,
(2) පළාත් පාලන අයතන ගාස්තු වශයෙන් 1% ක්ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 ½% වියදම් වන අතර,
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු,
(5) විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2000 වේ.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ හා අයකර ගැනීම) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10 වෙත දිය යුතුය. දුරකථන අංක 2661805, 2661808.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු විමසන්න. කළමනාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661815, 2661817.

රංජිත එස් මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර් එස් එම් ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ, කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

07-230

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/16/2664/කේවයි2/889.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004 පෙබරවාරි මස 13 දින *ගැසට් පත්‍රයේ* සහ 2005 නොවැම්බර් මස 07 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006 අගොස්තු මස 19 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ආදායම් නිලධාරි කොට්ඨාසයේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තිස්ස අමුණ ග්‍රාම සේවක කොට්ඨාසයේ දිවුලන්කඩවල 116 ග්‍රාමයෙහි පිහිටි දිවුලන්කඩවල කැලේ නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. බී. අබේකෝන් විසින් සැකසුණු 1997 ඔක්තෝබර් මස 18 දින අංක 719 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 0 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 4/20/105 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 30 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269.

06-259/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/16/0957/කේවයි1/665.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004 ඔක්තෝබර් මස 22 දින *ගැසට් පත්‍රයේ* සහ 2005 ජුනි මස 25 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.19 වැනි දින පෙ. ව. 9.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ආදායම් නිලධාරි කොට්ඨාසයේ 70, ගිරිතලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ජයන්ති ජනපදයේ පිහිටි අග්බෝවත්ත නමැති ඉඩමෙ සර්වේ ජනරාල්වරයා විසින් සැකසුණු 1965 සැප්තැම්බර් සහ 1970 අප්‍රේල් දිනයන් හා අංක 42 දරන අවසන් ජනපද පිඹුරේ කැබලි අංක 324 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, පර්. 12 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 02/935 යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙම ඉඩම බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් සැකසුණු 1995.07.17 දින හා අංක 10138 දරන පිඹුර මගින් මැනකදී මනින ලද්දකි.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 30 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269.

06-259/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/16/2010/කේවයි2/316.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002 සැප්තැම්බර් මස 13 දින *ගැසට් පත්‍රයේ* සහ 2002 නොවැම්බර් මස 18 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.19 වැනි දින පස්වරු 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ආදායම් නිලධාරි කොට්ඨාසයේ යාය 12 මැදිරිගිරිය කොට්ඨාස අංක 101 ග්‍රාමසේවක බල ප්‍රදේශයේ කවුඩුළු වැව II පියවර ග්‍රාමසේවක බල ප්‍රදේශයේ කවුඩුළු වැව ග්‍රාමයෙහි පිහිටි ගොඩ

ඉඩම නමැති ඉඩමෙහි සර්වේයර් ජනරාල්වරයා විසින් සකසන ලද 1993.03.17 දින හා අ. භූ. පි 11 දරන පිඹුරේ කැබලි අංක 3396/2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.419 ක්වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ එය මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල්. ඩී. සී. 4/11/278 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 16 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269.

06-259/3

---

## සීමාසහිත සෙලාන් බැංකුව – පිටකොටුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

බෙදා වෙන් කළ සීමා නිර්ණය කළ අගනා ඉඩම් කොටස් 2 බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කරු කෝරලේ අධිකාරිපත්තුවේ කොලොන්නාව නගර සභා සීමාව ඇතුළත එගොඩ කොලොන්නාව ග්‍රාමයේ පිහිටි අංගොඩ පාරේ වරිපනම් අංක 304/20 දරන දත්ගහකුඹුර නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1991 සැප්තැම්බර් මස 29 දාතම සහ අංක 10185 දරන පිඹුරේ ලොට් 14ඒ සහ ලොට් 14බී වශයෙන් ලකුණු කොට නිරූපිත බිම් කොටස් (ප්‍රමාණයෙන් ලොට් 14ඒ පර්චස් 7ක සහ ලොට් 14බී පර්චස් 8ක ඉඩම) එහි ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ අනෙකුත් සියලු දේ සමග බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 1990 ජූනි 06 දාතම හා අංක 1183 දරන පිඹුරේ ලොට් 5 සහ 13 වශයෙන් ලකුණු කොට නිරූපිත මාර්ගය සඳහා වෙන් කළ කොටස් සහ එකී අංක 1183 පිඹුරේ නිරූපිත මාර්ගයන්ද මතින් හා ඔස්සේ මාර්ග අයිතියද හා සමගය.

*දේපළ වෙත පිවිසෙන අන්දම*.– කොලොන්නාව නගර මධ්‍යයේ සිට කොලොන්නාව පාරේ සහ ගොතටුව පාරේ (අයිඩීඑච් පාරේ) සැතපුමක් පමණ ගොස් ගංවතුර ආරක්ෂණ බැම්ම පසෙකින් දකුණු පසට හැරී (කන්ද පහත දිවෙන) ගමගේ වත්ත පාරේ, යාර 250ක් පමණ ගියවිට ආධාරක මිනුම් පිඹුරේ දැක්වෙන පරිදි දකුණු පස පිහිටි තක්සේරු කළ යුතු මෙම දේපල හමුවේ.

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2006 ජූලි 31 වැනිදා සඳුදා පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(කොළඹ 11 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතික අංක ඩබ්ලිව්/ 8541 දරන සුමිර් ට්‍රේඩිස් ඇන්ඩ් ට්‍රැවල්ස් වන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන මොහමඩ් නිසාර් සුමිර් මොහොමඩ් යන අයට අයත් දේපළ, ප්‍රසිද්ධ නොතාරිස් ඒ ඩබ්ලිව්. ඒ. එම්මානුවෙල් විසින් ලියා සහතික කළ 1995 නොවැම්බර් මස 28 දාතම හා අංක 728 සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් ලියා සහතික කළ 2000 ජනවාරි 27 දාතම අංක 2404 දරන උකස් බැඳුම්කර මත ගෙවිය යුතු මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයිනි)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005. ජූලි මස 15 වන දින *රජයේ ගැසට් පත්‍රයද*, 2005 නොවැම්බර් මස 11 වන දින ඩේලි මිරර් ලංකාදීප හා 2005.11.28 දින වීරකේසරි පුවත්පතද විකුණුම් නිවේදනය සඳහා 2006.07.14 වන දින *රජයේ ගැසට් පත්‍රයද* බලන්න.

*ගාස්තු ගෙවන පිළිවෙල* .–

1. මිල තීන්දු වූ වහාම ගැණුම් මිලෙන් 10%ක්,
2. ගැනුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩකරන (කාර්යාල) දින 30ක් ඇතුළත,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට) දේශීය අලෙවි බදු,
4. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල රු. 40,781.24 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50%,
5. ලිපිකරු හා නිවේදන ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 4000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ 03, ගාලු පාරේ අංක 90 සෙලින්කෝ ටවර්ස් හි 12 වන මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබා ගෙන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංක 2456283-4, 4-701000

ඩන්ස්ටන් කෙලාට්
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්, විශේෂඥ වෙන්දේසිකරු
තක්සේරුකරු සහ දේපළ නියෝජිත.

අංක 381-1/1, ගාලු පාර, අංක 04
දුරකථන අංකය : 2591167,
දුරකථන/ෆැක්ස් අංක : 2584874/2500838,
ක්ෂණික ඇමතුම් : 0772250422

07-231

### සීමාසහිත සෙලාන් බැංකුව -නාවල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පදිංචියට ව්‍යාපාරයකට සුදුසු ඉතා වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වැලිගම නගර සභා සීමාව තුළ 1 වැනි හරස් වීදියේ පිහිටි වරිපනම් අංක 05 (පැරණි අංක 2164) දරන තල්පෙගෙවත්ත යන ඉඩමෙන් බෙදූ කොටසක් ප්‍රමාණය පර්චස් 71.57 විශාල ඉඩම හා එහි තුළ පිහිටි සියලු දේ (වැලිගම තානායමට ඉතා ආසන්නව).

මෙම දේපල නුගේගොඩ පාගොඩ පාර අංක 33ඒ හි පිහිටි ආර්. ඇන්ඩ්. ඩී. එන්ටප්‍රයිසස් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන වර්ණකුලසූරිය ආරච්චිගේ දොන් රොහාන් දර්ශන තෝමස් සහ සුදුවැලි කොණ්ඩගේ ශාන්තිනි දමයන්ති *නොහොත්* ශාන්තිනි දමයන්ති තෝමස් යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇත.

2006ක් වූ අගෝස්තු මස 01 වැනි දින පෙ. ව. 11.00 ටඑම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2000 ජූලි මස 28 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද,* 2000.08.28 වැනි දින අයිලන්ඩ් 2000 ජූලි මස 17 දිනමිණ හා 2000 ජූලි මස .11 වැනි දින තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011-2456258, 077-7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,වටපුළුව, මහනුවර.
දුරකථන අංක :081-2211025, 071-4755974, 071-4213497 071-2755974
ෆැක්ස් අංකය :081-2211025.

07-252/1

### සීමාසහිත සෙලාන් බැංකුව -සෙලින්කෝ හවුස් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ව්‍යාපාරයට සුදුසු ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ඇතුල්කෝට්ටේ පිහිටි "අගලබෝදාවත්ත" නැමති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි කෝට්ටේ පාර වරිපනම් අංක 663 ඒ/1, 663 ඒ/1/1, 663 ඒ 1-1/2 දරන ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය - පර්චස් 4.7යි.

මෙම දේපල "එන් ඇන්ඩ් අයි මර්චන්ඩයිසිං කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ්" බන්දනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2006ක්වූ ජූලි මස 31 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004 දෙසැම්බර් මස 31 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද* 2004 දෙසැම්බර් මස 17 වැනි දින දිනමිණ, ඩේනිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. -

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක :011-4701256, 011-2456258, 077-7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,වටපුළුව, මහනුවර.
දුරකථන අංක: 081-2211025, 071-4755974, 071-4213497 071-2755974
ෆැක්ස් අංකය :081-2211025.

07-252/2

සීමාසහිත සෙලාන් බැංකුව -පිටකොටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඉතා වටිනා ව්‍යාපාරික දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ මහ නගර සභා සීමාවන් තුළ පිටකොටුව - සී ස්ට්‍රීට් (හෙට්ටි වීදිය) හි 01. වරිපනම් අංක 11 දරන ස්ථානයේ පිහිටි සියලු පහසුකම් සහිත තෙමහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල හා එයට අයත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 12.8යි.

02. වරිපනම් අංක 23 දරන ස්ථානයේ පිහිටි සියලු පහසුකම් සහිත තෙමහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල (පොළවෙන් යට පිහිටි මහළද ඇතුළත්ව) හා එයට අයත් සියලු දේ මුලු බිම් ප්‍රමාණය - වර්ග අඩි 10,753.0.

මෙම දේපල යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන "ෆා ඉම්පෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2006ක් වූ ජූලි මස 31 වැනි දින ප. ව. 2.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006 ජනවාරි මස 12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද* 2005 නොවැම්බර් මස .11 වැනි දින ටයිම්ස්, ලංකාදීප සහ 2005 නොවැම්බර් මස 29 වැනි දින වීරකේසරී යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011-2456258, 077-7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497 071-2755974
ෆැක්ස් අංකය : 081-2211025.

07-252/3

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරිය හා එහි සංශෝධන වල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004 පෙබරවාරි 13 දිනැති අංක 1328 දරන *ගැසට් පත්‍රයේ* හා 2004. පෙබරවාරි මස .03 දිනැති දිනමිණ, තිනකරන්, ඩේලිනිවුස් යන පුවත්පත් වල පල කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2006. අගෝස්තු මස .05 වෙනි දින පෙ. ව. 11.30 ට ගම්පහ උසාවිය පාර, සනස චතුරශ්‍රය අංක 15 හි පදිංචි ටී. එම්. එස්. පීරිස් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලයේ,මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ කොස්කඳවල ග්‍රාමයේ පිහිටි හොරගහලන්ද නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ එම්. ආර්යසේන විසින් සාදන ලද 1996 මැයි 25 දිනැති අංක 645 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී 3 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් බී ද, නැගෙනහිරට: අංක 756 දරන පිඹුරේ ලොට් 1 හි ඉතිරි කොටසද, දකුණට: පාරද, බස්නාහිරට: ප්‍රාදේශීය සභා පාරද, මායිම් ව එකී අංක 645 දරන පිඹුර අනුව පර්චස් විසි පහක් (අ.0, රූ.0,පර්. 25) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හයයි තුනයි තුනක (හෙක්. 0.0633) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේ වේ.

එකී ඉඩම් කැබැල්ල පහත විස්තර කළ ඉඩමෙන් බෙදන ලද්දාවූ නිශ්චිත කොටසකි.

එකී කොස්කඳවල හි පිහිටි "හොරගහලන්ද" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ.. එම්. ආරියසේන විසින් සාදන ලද 1995 සැප්තැම්බර් 17 දිනැති අංක 474 දරන පිඹුරේ ලොට් බී වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: ලොට් ඒ ද, නැගෙනහිරට: අංක 756 දරන පිඹුරේ ලොට් 1 හි ඉතිරි කොටසද, දකුණට: පාරද, බස්නාහිරට: ප්‍රාදේශීය සභා පාරද, මායිම්ව එකී අංක 474 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් තිහක (අ.0,, රූ. 1, පර්. 30) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හතයි හතයි එකක (හෙක්. 0.01771) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 450/184 හි ලියාපදිංචි කර ඇත.

ජේ. එම්. ඒ. ආරියරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව ගම්පහ.

07-228

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100004294/0100003773.

ණයකරුගේ සම්පූර්ණ නම : වික්‍රමසිංහ රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ අශෝක සේනක බණ්ඩාර සහ තලපත වඩන මුදියන්සේලාගේ සුරංගී ප්‍රදීපා කුමාරි කරුණාරත්න.

(මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006 ජූනි මස 02 වන දින අංක 1445 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006 ජූනි මස 08 වන දින ලක්බිම, ද අයිලන්ඩ්, තිනකුරල්, පුවත් පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 15, සණස සංකීර්ණය, උසාවිය පාර, ගම්පහ යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ටී. එම්. එස්. පීරිස් මයා විසින් 2006 ජූලි මස 31 වන දින පෙ.ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ අසූපන්දහස් අටසිය නවයයි ශත විසිහයක් (රු. 285,809.26) මුදලක් වර්ෂ 2002. ඔක්තෝබර් මස 31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ විසිදහස් නවසිය හැටනවයයි ශත අනූනවයක (රු. 2,20,969.99) මුදල ද, 2002 ඔක්තෝබර් මස 31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැටහතර දහස් අටසිය තිස්නවයයි ශත විසිහතක් (රු. 64,839.27) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ අසූපන්දහස් අටසිය නවයයි ශත විසිහයක් (රු. 2,85,809.26) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ විසිදහස් නවසිය හැටනවයයි ශත අනූනවයක් (රු. 2,20,969.99) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% සහ 17% බැගින් වන පොළියක් 2002. නොවැම්බර් මස 01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිනිස

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ උඩුපිල ග්‍රාමයේ හි පිහිටි බටදොඹ ගහලන්ද (කොටසක්) හා මිල්ලගහවත්ත නැමැති ඉඩමට 1997 ජූනි මස 18 දින ජී. ජී. පී. හස්තනායක මානක තැන වි සින් මැන සම්පාදිත අංක 1497 පිඹුර ප්‍රකාර ලොට් 4 ට මායිම්, උතුරට: ලොට් 13 (මාර්ග රක්ෂිතය ද), නැගෙනහිරට: ලොට් 5 ද, දකුණට: එල්. ඩී. ගුණසේන හා අනෙකුත් අයට අයිති ලොට් බී ද, බටහිරට: ලොට් 3 ද, යන මායිම් තුල පිහිටි පර්චස් පහලොවක් (අක්. 0, රූ.0, පර්.15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග අයිතියද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 466/97 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක්වූ ජූනි මස 30 දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

---

07-233

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0200001707.

ණයකරුගේ සම්පූර්ණ නම : ටිකිරි මුදියන්සේලාගේ අනුර චන්ද්‍රසේකර.

(මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003 ජනවාරි මස 17 වන දින අංක 1272 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003 ජනවාරි මස 23 වන දින දිනමිණ, ද අයිලන්ඩ්, තිනකුරල්, පුවත් පත්'වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 15 සණස චතුරශ්‍රය, උසාවිය පාර, ගම්පහ හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ටී. එම්. එස්. පීරිස් මයා විසින් 2006 ජූලි මස .31 වන දින පෙ.ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බ ව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ වි ධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ තුන්දහස් එකසිය හැත්තෑ හතරයි ශත හැත්තෑ තුනක (රු. 4,03,174.73) මුදලක් වර්ෂ 2002. ජූනි .30 දින වන සිට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අනූඅටදහස් තුන්සිය විසිඑකයි ශත තිස්එකක (රු. 2,98,321.31) මුදලද, 2002 ජූනි 30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හාරදහස් අටසිය පනස්තුනයි ශත හතලිස් දෙකක් (රු. 1,04,853.42) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ තුන්දහස් එකසිය හැත්තෑ හතරයි ශත හැත්තෑ තුනක (රු. 4,03,174.73) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ අනූඅටදහස් තුන්සිය විසිඑකයි ශත තිස්එකක (රු. 2,98,321.31) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.87% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මැද පත්තුවේ සියනෑ කෝරළේ මහර ප්‍රාදේශීය සභාවේ ඇටිකෙහෙල්ගල්ල ග්‍රාමයේ පිහිටි නුගගහවත්ත නැමැති ඉඩමට වර්ෂ 1999.07.12 දින එල්. ජේ. ලියනගේ මානක තැන විසින් මැන සැකසූ අංක 7912 පිඹුර ප්‍රකාර ලොට් 01 ඉඩමට මායිම් උතුරට: ලයනල් විජේසිංහට අයිති ඉඩම හා ලොට් 2 ද, නැගෙනහිරට: ඩබ්. පී. රංජිත්ගේ ඉඩම හා ලොට් 2 ද, දකුණට: ඩබ්. පී. සෝමලතාගේ ඉඩම හා ලොට් 2 ද, බස්නාහිරට: එම්. එච්. ආරියතිලගේ ඉඩම ද යන මායිම් තුල පිහිටි රූඩ් එකක (අක්. 0, රූඩ්. 1, පර්.0) වපසරියකින් යුතු ඉඩම හා ඊට අයත් සියළු දේද සහ මාර්ග පරවශතාවය ද සමඟ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 590/25 හි ලියාපදිංචි කරන ලදී.

වර්ෂ 2006 ක්වූ ජූනි හම 30 දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.